දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2876169, 011-2876181
විද්‍යුත් තැපැල / மின்-அஞ்சல் / E-mail: info@psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

ලැබුණා 11 AUG 2026 ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය උපදේශන අංශය

RECEIVED 07 AUG 2026

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
# பகிரங்க சேவை ஆணைக்குழு அலுவலகம்
# OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
No. 1200/9, Rajamalwatta Road, Battaramulla.

මගේ අංකය / எனது இல. / My No.: PSC/EST/03-01-38/03/2019

ඔබේ අංකය / உமது இல. / Your No.: MRDSS&CE/COUN, 01/බඳවාගැනීම් (II වෙළුම)

දිනය / திகதி / Date: 2026.08. 05

ලේකම්,
ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය

**<u>ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශයෙහි ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ මනෝවිද්‍යා උපදේශන නිලධාරි තනතුර සඳහා වන සංශෝධිත බඳවා ගැනීම් පටිපාටිය ඇමුණුම 03 විභාග පිළිබඳ ආකෘතිය සංශෝධනය කර ගැනීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබේ සමාංක හා 2026.04.24 දිනැති ලිපිය හා බැඳේ.

02. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2019.10.24 අනුමත කර 2020.08.28 දින සහතික කරන ලද ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශයෙහි ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ මනෝවිද්‍යා උපදේශන නිලධාරි තනතුර සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය මේ සමඟ ඇති ඇමුණුමෙහි (පිටු 2 කින් යුතු) සඳහන් සංශෝධන ඇතුළත් කර සංශෝධනය කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2026.07.24 දින අනුමැතිය ලබා දී ඇති බව, එම කොමිෂන් සභාවේ නියමය පරිදි කාරුණිකව දන්වමි.

03. මේ පිළිබඳව අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, අදාළ සංශෝධනයන් බඳවා ගැනීමේ පටිපාටියේ සටහන් කර තබන ලෙසත් වැඩිදුරටත් දන්වමි.

දේශමාලි කුමාරසිංහ
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන I)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට

පිටපත: ආයතන අධ්‍යක්ෂ ජනරාල් - කරු.දැ.ගැ.ස. හා අ.ක.ස.

ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශයෙහි ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ (MN 04) මනෝවිද්‍යා උපදේශන නිලධාරි තනතුර සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය දෙවන සංශෝධනය

| අදාළ වගන්තිය | | යෝජිත සංශෝධනය |
|---|---|---|
| 01 | 1.2 | පහත පරිදි සංශෝධනය කළ යුතුය.<br>අමාත්‍යාංශය : කාන්තා, ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ<br><br>යොමු අංකය: MPI&SE/ADM/12/02 දිනය : 2019.06.20<br><br>නව අමාත්‍යාංශය : සමෘද්ධි,ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා ඌණ උපයෝජන රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය<br><br>නව යොමු අංකය : MWCA&SS/COUN/ 06/03 දිනය: 2020.09.<br><br>නව අමාත්‍යාංශය : ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම්<br><br>නව යොමු අංකය : MRDSS&CE/COUN/ 01/01/බඳවාගැනීම් (II වෙළුම) දිනය: 2026.04.24 |
| | 1.6 | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය:<br>යොමු අංකය: PSC/EST/03-01-38/03/2019 දිනය : 2019.10.24<br>පළමු සංශෝධනය: 2021.11.17<br><br>දෙවන සංශෝධනය: 2026.07.24 |
| 02. | | පත් කිරීමේ බලධරයා: රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ ලේකම් |
| 04. | | තනතුරෙහි/ තනතුරුවල ස්වභාවය:<br>ස්ථිර විශ්‍රාම, වැටුප් සහිත |
| 06 | 6.1 | අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා එම තනතුරුවලට පැවරෙන කාර්යයන් |
| 07 | 7.2.2.2. | වෘත්තීය සුදුසුකම්<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ආයතනයකින් හෝ ජාතික සමාජ සංවර්ධන ආයතනය මඟින් ලබාගත් වසරකට නොඅඩු උපදේශන පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා සමත් වී තිබීම.<br><br>ලෙස අක්ෂර වින්‍යාසය නිවැරදි කරන්න |
| | 7.2.4.4.1 | යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩල පත් කරන බලධරයා: ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ ලේකම් |
| 08 | 8.2 | කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක් ද : අවම වශයෙන් වසරකට වරක් |
| | 8.3 | කාර්යක්ෂමතා කඩඉම්වලට අදාළ පරීක්ෂණ<br>වගුවේ "පවත්වනු ලබන බලධරයා" තීරුව<br>ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශ ලේකම්<br><br>ලෙස සංශෝධනය විය යුතුය. |

CamScanner